# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
# ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය
# මාර්ග සංවර්ධනය අධිකාරිය (RDA)

# ලංසු IFB :- RDA/EE/BB/2024/01

මාර්ග සංවර්ධන අධිකාරියේ බිබිල විධායක ඉංජිනේරු කාර්යාලීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මාර්ග සංවර්ධන අධිකාරිය , බිබිල විධායක ඉංජිනේරු කොට්ඨාශයේ මාර්ග සංවර්ධන හා නඩත්තු කටයුතු සදහා අවශ්‍ය කම්කරුවන් සපයා ගැනීම සහ බැකෝ ලෝඩර්යක් ලබාගැනීම සදහා යෝග්‍යතා පූර්ණ සුදුසුකම් සැපයුම්කරුවන්ගෙන් වෙන වෙනම මුද්‍රා තබන ලද ලංසු කැදවනු ලැබේ.

බිබිල හා සියඹලාණ්ඩුව ඒකකයන්ට අයත් මාර්ග සදහා (කම්කරු)

| අනු අංකය | ලංසු කැදවුම් අංකය | විස්තරය | ඇස්තමේන්තු මුදල (මිලියන ) | ලංසු ඇපකරය (රු) |
|---|---|---|---|---|
| 01 | EE/BB/RDA/ Quotation /2024/39 | කොළඹ රත්නපුර වැල්ලවාය මඩකලපුව මාර්ගයේ (කි.මී 272 – 293 හා කි.මී 265 – 272 ) නඩත්තු කටයුතු | 3.3 | රු. 5,000.00 |
| 02 | EE/BB/RDA/Quotation/2024/40 | සියඹලාණ්ඩුව දමන අම්පාර මාර්ගයේ (කි.මී 0 – 24) නඩත්තු කටයුතු | 3.0 | රු. 5,000.00 |
| 03 | EE/BB/RDA/Quotation/2024/41 | පේරාදෙණිය බදුල්ල චෙන්කලඩි මාර්ගයේ (කි.මී 191 +800-210 +000 හා කි.මී. 171-160 ) නඩත්තු කටයුතු | 3.55 | රු. 5,000.00 |
| 04 | EE/BB/RDA/Quotation/2024/42 | පස්සර මොණරාගල මාර්ගයේ (කි.මී 25 + 200 – 7+140 ) නඩත්තු කටයුතු | 2.25 | රු. 5,000.00 |
| 05 | EE/BB/RDA/Quotation/2024/43 | බිබිල පිටකුඹුර නාමල්ඔය ඉගිනියාගල මාර්ගයේ (කි.මී 6-37 ) නඩත්තු කටයුතු | 3.8 | රු. 5,000.00 |
| 06 | EE/BB/RDA/Quotation/2024/44 | බිබිල මැදගම නක්කල මාර්ගයේ (කි.මී 3 – 27 ) නඩත්තු කටයුතු | 3.0 | රු. 5,000.00 |
| 07 | EE/BB/RDA/Quotation/2024/45 | කොළඹ රත්නපුර වැල්ලවාය මඩකලපුව මාර්ගයේ (කි.මී 272 – 293 ) සියඹලාණ්ඩුව දමන අම්පාර මාර්ගයේ (කි.මී 0 – 24) පළුදු මැකීමේ කටයුතු හා වැලි මුද්‍රිත තාර ආලේපන කටයුතු | 2.25 | රු. 5,000.00 |

සියඹලාණ්ඩුව ඒකකයට අයත් මාර්ග සදහා (බැකෝ ලෝඩර්යක් )

| අනු අංකය | ලංසු කැදවුම් අංකය | විස්තරය | ඇස්තමේන්තු මුදල (මිලියන ) | ලංසු ඇපකරය (රු) |
|---|---|---|---|---|
| 01 | EE/BB/RDA/Quotation/2024/46 | සියඹලාණ්ඩුව ඒකකයේ මාර්ග නඩත්තු කටයුතු | 5.0 | රු. 5,000.00 |

01. ලංසු කැඳවීම ජාතික ලංසුකරණ පටිපාටිය අනුව සිදු කරනු ලැබේ.

02. ලංසු අවසන් කරන දින සිට කැලැන්ඩර් දින 153 ක් (2024.12 .31 ) දක්වා ලංසු වලංගු විය යුතුයි .

03. ලංසු ඉහත වගුවේ දැක්වෙන වටිනාකමකින් යුත් ලංසු ආරක්ෂණයකින් සමන්විත විය යුතුය. (2024.12.31 දින දක්වා වලංගු විය යුතුය. එය පිළිගත් බැංකුවකින් පළාත් භාර අධ්‍යක්ෂ (ඌව) යන නමට ලබාගත් ලංසු ඇපකරයක් හෝ පළාත් භාර අධ්‍යක්ෂ (ඌව), ලංකා බැංකුව බණ්ඩාරවෙල ශාඛාවේ ගිණුම් අංක 2068132 වෙත මුදලින් තැම්පත් කොට ලබා ගන්නා ලදුපත ඉදිරිපත් කළ යුතුවේ. වලංගු ලංසු ආරක්ෂණයකින් සමන්විත නොවන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. මිළ ගණන්පත් ගෙවීමකින් තොරව විධායක ඉංජිනේරු මාර්ග සංවර්ධන අධිකාරිය , බිබිල වෙතින් පරීක්ෂා කර බැලිය හැකිය.

05. මේ සඳහා ඉදිරිපත් වන ලංසු කරුවන් 2024.07.12 වන දින සිට 2024.07.29 වන දින දක්වා පෙ.ව 9.00 සිට ප.ව 15.00 පැය කාර්යාල වෙලාව තුල ආපසු නොගෙවනු ලබන රු.1,000 .00 (බදු රහිත ) ගාස්තුවක් විධායක ඉංජිනේරු කාර්යාලය මාර්ග සංවර්ධන අධිකාරිය , බිබිල වෙත ගෙවීමෙන් අනතුරුව ලංසු අයදුම්පතක් ලබාගත හැකිය. ( මෙම මුදල ලියාපදිංචි සපයුම්කරුවන් සඳහා අදාළ නොවේ )

06. ලංසුපත් සම්බන්ධ වැඩි විස්තර ලංසුපත් සමග ඉදිරිපත් කරනු ලැබේ .

07. සම්පූර්ණ කළ මුද්‍රා තබන ලද මිල ගණන්පත් 2024.07.29 වන දින ප.ව 15.30 ට හෝ ඊට පෙර **විධායක ඉංජිනේරු මාර්ග සංවර්ධන අධිකාරිය , බිබිල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම සිදු කළ යුතුයි.

08. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේ ඒකී ලංසු විවෘත කරනු ලැබේ.

09. ඔබගේ ලංසුපත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි අදාළ ලංසු කැඳවීම් අංකය සඳහන් කළ යුතුය.

10. සියළු විමසීම් සඳහා දුරකථන අංක 055- 226 5427

සභාපති,
ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,
විධායක ඉංජිනේරු කාර්යාලය,
බිබිල.

# කොන්දේසි හා සැපයීම පිළිබඳ විස්තර (කම්කරු)

01.මිල ගණන් කැඳවීම් අංක EE/BB/RDA/Quotation/2024/39,41,43 යටතේ උපරිම කම්කරුවන් 09 ක් හා EE/BB/RDA/Quotation/2024/40,44 යටතේ උපරිම කම්කරුවන් 08 හා EE/BB/RDA/Quotation/2024/45 උපරිම කම්කරුවන් 06 2024.08.01 සිට 2024.12.31 දක්වා කාල සීමාවක් සඳහා ලබාගැනීම.

02. එක් එක් උප කොන්ත්‍රාත් සඳහා වෙන වෙනම අවම ලංසු මුදලක් තබා ඇති හා නියමිත සුදුසුකම් සපුරා ඇති කොන්ත්‍රාත්කරුවන් සලකා බලනු ලැබේ.

03. කම්කරුවන් දිනපතා පැමිණීම හා පිටවීම ලේඛනගත කිරීමට චෙක්රෝල් පතක් ඔබ විසින් නිකුත් කල යුතුය. තවද ඔබ විසින් අත්සන් හෝ ඇඟිලි සලකුණු සඳහා ලේඛනයක් නඩත්තු කලයුතුය.

04. නුපුහුණු කම්කරුවන්ගේ චෙක්රෝල් පත් හා ඇඟිලි සලකුණු ලේඛන වල මුල් පිටපත් ගෙවීම් ලබා ගැනීමට වවුචර් පත හා ඉල්ලීම් ලිපිය සමග ඉදිරිපත් කළ යුතු අතර , අපැහැදිලි හා නොගැලපෙන අත්සන් ලේඛන හා චෙක්රෝල් පත් සඳහා ගෙවීම් කරනු නොලැබේ.

05. නුපුහුණු කම්කරුවන් සේවයේ යොදවන කාලය පෙ.ව 8.00 සිට ප.ව 5.00 අතර වේ. (තේ විවේකය හා දිවා ආහාරය සඳහා උපරිම පැයකි ) ඒ අනුව පැය 08 ක් සේවා කාලයක් වේ. අවශ්‍යතාවය අනුව අමතර සේවයේ යොදවා ගැනීමට අවශ්‍ය වුවහොත් සේවයේ යෙදවිය යුතු අතර ඒ සඳහා අතිකාල දීමනා ගෙවනු ලැබේ.

06. නුපුහුණු කම්කරුවන් සදුදා සිට සිකුරාදා දින දක්වා සේවයේ යෙදවිය යුතු අතර , අවශ්‍යතාවය මත අනෙකුත් නිවාඩු දිනයන් හි විධායක ඉංජිනේරු උපදෙස් මත පමනක් සේවයේ යෙදවිය යුතුය.

07. නියමිත වේලාවට සේවයට පැමිණ සිටිය යුතු අතර ප්‍රමාදවී පැමිණියහොත් සේවයේ යොදවනු නොලැබේ. තවද එකම කණ්ඩායමක් සේවයේ යෙදවිය යුතුය. නුපුහුණු කම්කරුවන් මාර්ග නඩත්තු කටයුතු සඳහා සුදුසු විය යුතු අතර මනා සෞඛ්‍ය තත්වයෙන් සිටිය යුතුයි.

08. නුපුහුණු කම්කරුවන් සේවයේ යොදවන ලබනු කාල සිමාව සඳහා නුපුහුණු කම්කරුවන් නීති රීති වලට අනුව ETF හා EPF ගෙවීම් කිරීම ඔබ විසින් සිදුකල යුතු ගෙවීම් කරන අතර , ගෙවීම් කරන ලද "C" පෝමරය අදාළ ඉන්වොයිස් පත සමග ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැති නම් ගෙවීම් සඳහා නිර්දේශ කරනු නොලැබේ. තවද කම්කරුවන් සේවයේ යෙදවීමේදී රට තුළ බලපාන සියලුම නුපුහුණු කම්කරුවන් නීති රීති හා අණ පනත් විධිවිධාන (සේවක අර්ථසාදක අරමුදල , සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායක කිරීම හදිසි අනතුරු වන්දි ගෙවීම් වැටුප් හා අතිකාල ගෙවීම් ඇතුළු රක්ෂණාවරණ ආදීය) සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුට වගකීම පැවරෙන අතර ඒ සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය වගකීමට බැඳී නොසිටන අතර , කොන්ත්‍රාත්කරු සමග ගිවිසගත් අයුරින් සේවය ලබා ගැනීම පමණක් මාර්ග සංවර්ධන අධිකාරියෙන් සිදුවේ,

09. කෑම හෝ තේ ආදිය නොසපයෙන අතර,නුපුහුණු කම්කරුවන් ඉහත ස්ථානයේ මාර්ගයේ සේවය සඳහා වාර්තා කල යුතු අතර ප්‍රවාහන පහසුකම් ඔබ විසින් සැපයිය යුතුවේ.

10. වැඩ කටයුතු සඳහා අවශ්‍ය යන්ත්‍ර ආයුධ හා ද්‍රව්‍යය මාර්ග සංවර්ධන අධිකාරිය මගින් සපයනු ලැබේ.

11. ඔබ අගය මත එකතු කළ බදු (වැට්) ලියාපදිංචිකරුවෙකු නම් වැට් බදු ලියාපදිංචි අංකය සහිත වැට් බදු ඉන්වොයිස් පතක් ඉදිරිපත් කලයුතුය.

12.ඔබ මෙම සැපයුම් කොන්ත්‍රාත්තුවට තේරී පත්වුවහොත් අනිවාර්යෙන්ම මාර්ග සංවර්ධන අධිකාරිය සමග ගිවිසුමකට එළඹිය යුතුය .

13. වැඩ මාසයක අවසානයේ ඔබගේ ඉන්වොයිස්පත මා වෙත ඉදිරිපත් කළ යුතුය. ඉන්වොයිස්පත ඉදිරිපත් කර දින 30 ක් තුල ගෙවීම් සිදු කරනු ලබන අතර නොවැලක්විය හැකි හේතුන් මත එම දින නිමයන් වෙනස් විය හැක .

14. ලැබෙන ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනීම් හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය ටෙන්ඩර් මණ්ඩලය සතු වන අතර , ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

# කොන්දේසි හා සැපයීම පිළිබඳ විස්තර (බැකෝ ලෝඩර්යක් )

01.මිල ගණන් කැඳවීම් අංක EE/BB/RDA/Quotation/2024/46 යටතේ අවම පැය 850 ක් 2024.08.01 සිට 2024.12.31 දක්වා කාල සීමාවක් සඳහා ලබාගැනීම.

02. එක් එක් උප කොන්ත්‍රාත් සඳහා වෙන වෙනම අවම ලංසු මුදලක් තබා ඇති හා නියමිත සුදුසුකම් සපුරා ඇති කොන්ත්‍රාත්කරුවන් සලකා බලනු ලැබේ.

03. සපයනු ලබන යන්ත්‍රය ඉතා හොඳ තත්වයේ තිබිය යුතු අතර, එය නිසිපරිදි ක්‍රියාත්මක විය යුතුය. සම්පූර්ණ රක්ෂණ සහතිකය / ආදායම් බලපත්‍රය ඉදිරිපත් කළ යුතුය. එය නිෂ්පාදිත වර්ෂය 2006 පසු විය යුතුය . ධාවන මීටරය නිසිපරිදි ක්‍රියා කළ යුතුයි.

04. ඔබ මෙම සැපයුම් කොන්ත්‍රාත්තුවට තේරී පත්වුවහොත් අනිවාර්යෙන්ම සේවයේ යෙදවීමට පෙර මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු බිබිල සමග ගිවිසුමකට එළඹිය යුතුය .

05. සේවා කාලය පෙ.ව 8.00 සිට ප.ව 5.00 දක්වා වන අතර , හදිසි අවස්ථාවන් හිදී එම කාලය වෙනස්විය හැක. පළපුරුදු යන්ත්‍ර ක්‍රියාකරුවෙකු සැපයීම අනිවාර්ය වේ.

06. යන්ත්‍රය සඳහා ඉන්ධන ඔබ විසින් සැපයිය යුතුවේ. අදාළ කොට්ඨාශය වෙත යන්ත්‍රය රැගෙන ඒම හෝ ආපසු රැගෙන යෑමට අධිකාරියෙන් කිසිදු ගෙවීමක් නොකරයි.

07. සදුදා සිට සිකුරාදා දින දක්වා සේවයේ යෙදවිය යුතු අතර , අවශ්‍යතාවය මත අනෙකුත් නිවාඩු දිනයන් හි විධායක ඉංජිනේරු උපදෙස් මත පමනක් සේවයේ යෙදවිය යුතුය.

08. ඔබ අගය මත එකතු කළ බදු (වැට්) ලියාපදිංචිකරුවෙකු නම් වැට් බදු ලියාපදිංචි අංකය සහිත වැට් බදු ඉන්වොයිස් පතක් ඉදිරිපත් කලයුතුය.

09. වැඩ මාසයක අවසානයේ ඔබගේ ඉන්වොයිස්පත මා වෙත ඉදිරිපත් කළ යුතුය. ඉන්වොයිස්පත ඉදිරිපත් කර දින 30 ක් තුල ගෙවීම් සිදු කරනු ලබන අතර නොවැලක්විය හැකි හේතූන් මත එම දින නිමයන් වෙනස් විය හැක .

10. ලැබෙන ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනීම් හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය ටෙන්ඩර් මණ්ඩලය සතු වන අතර , ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.